# ...ආදරය...



කතෘ:  ශයිනි අමාධි ශිහන්‍යා ඒකනායක

- කතෘ : ශයිනි අමාධි ශිහනායා ඒකනායක
- වයස : 12
- 8 ශ්‍රේණිය
- පාසල : මහාමායා බාලිකා විද්‍යාලය
- කෘතිය එළි දක්වන දිනය : 2023.11.15
- ISBN 978-624-206-877-0

# ...පිදුම...

ආදරය කරුණාව සෙනෙහස ලොකු කුඩා

කාටත් අවශ්‍ය කරුණකි

මෙම පොත රචනා කිරීමට උදව් වූ

දෙමාපියන්ටත්,

අයියාටත්, යෙහෙළියන්ටත් ස්තුතිවන්ත
වන අතර, අප පාසලේ විදුහල්පතිතුමිය
ඇතුලු ගුරු මඩුල්ලටත් මෙම කෘතිය
ආදරයෙන් පුදමි...

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# 1

සාරා ඉන්නෙ නගරයේ මැද තියෙන ලොකුම ලොකු ගෙදර. එයාගෙ අම්මයි තාත්තයි එයාට හිටියත් එයා කාලය ගත කලේ එයාගෙ නැනී එක්ක. නැනී ටිකක් තදයි එයා දෙයක් කිව්වොත් කිව්වම තමයි

හැමදාම උදේ 7.30 වෙනකොට සාරාගෙ අම්මයි තාත්තයි ඔෆිස් යනවා. තාත්තා ගෙදරින් එළියට යන්නෙත් ලැප් එකෙන් එයාගෙ වැඩ කර කර, අම්මා ඊටත් හපන් අම්මා එයාගෙ මේක් අප් එක හැමවෙලේම මූනෙ අතුල්ලනවා.

හැමදාම සාරා බලන් හිටියේ එයාගේ  දෙමාපියන් එයාල ඔෆිස් යනකොට සාරාට බායි කියනකම්. ඒත් මේ වෙනකම් සාරාට බායි කියලා තියෙන්නෙ එයාගෙ නපුරු නැනී විතරයි.

තාත්තා කාර් එකට නැග්ග ගමන් නැනීට කතා කරනවා. 8.00 වෙනකොට නැනී ගෙදරට එනවා.එයා කවදාවත් එන්නේ නැතුව ඉදලා නෑ.  එක දවසක් එයා අවේ නැත්තේ, ඒ එදා නැනීගේ ආච්චී පඩිපෙළෙන් වැටුන දවසේ. එදා සාරාට ඉන්න සිද්ද උනේ රෝහලේ.

මේ දවසෙත් හිතපු විදිහටම හැමදේම උනා. තාත්තා කාර් එකට නැග්ග ගමන් නැනීට කෝල් කලා. හැමදාම වගේ සාරා දොර වැහුවා. වහල එතනම

ඉදගෙන බිම පෙරලුනා. එදත් ඉතින් සාරාගෙ පූසා කිටී එයාගේ තුරුලට ඇවිත් පෙරලුනා

" ටක් ටක් ගෙදර කවුද? මම ආවා සාරා දොර අරින්න..." නැනී දොරට ගහපු විදිහට සාරාට ගොඩක් බය හිතුනා."මේ එනවා නැනී... පොඩ්ඩක් ඉන්න"

"හලෝ හලෝ හ..ලො........"නැනී ඇස් දෙක ලොකු කරලා සාර දිහා බලලා හිනා උනා...

"හොදයි අද වැඩ ටික වෙන්නේ මෙහෙමයි."

ලොකු ලැයිස්තුවක් පෙරලමින් නැනී සාරා දිහා කෘෘර විදිහට බැලුව.

එක 8.00 - 10.00ඉස්කෝලෙ වැඩ

දෙක 10.00 - 12.00 පාඩම් කරන්වා

තුන 12.00 - 12.30 දවල් ආහාරය

හතර 12.30 - 1.30 මොළේ දියුණු වෙන ක්‍රීඩාවක් කරන්න.

ඊට පස්සෙ පාඩම් වැඩ ආයෙත්.

"අනේ නැනී මට සෙල්ලම් කරන්න වෙලාව"

ඒයි කට! යන්ව යන්න. ලොකු පවුලක හැදුනට මොකෝ මේ ළමයගෙ කිසිම උනන්දුවක් නෑ දැන් යන්ව ගිහින් මම කියපු වැඩ කරන්වා." කියල නැනී සාරාට කෑ ගැහුව.

කොච්චර සැරද කිව්වොත් සාරාට කනේ ඇගිලි ගහගන්න තරම් හයියෙන් නැනී එයාට බැන්නා.

දැන් ඉතින් සාරා මේ කාලසටහනේ විදිහට වැඩ කරන්න ඕනේ.සාරා එයාගෙ කාමරයට ගිහින් එයාගෙ ගණන් ටික හැදුවා.ඒත් , එයාට හරියට ගනන් හදන්න බැහැ.මොකද කිව්වොත් එයාට මොකද්දෝ සද්දයක් එනවා පහළ තට්ටුවෙන්. සාරා හෙමීට පහළ තට්ටුවට ගිහින් බැලුවා. නැනී හයියෙන් සින්දු කිය කිය කෑම හදනවා.සාරා හොරෙන් ගිහින් බැලුවා , මොකද්ද අර සද්දේ කියලා ඒත් නැනීගේ කැතම කැත සිංදුව නිසා සාරාට කිසිම දෙයක් ඇහුනේ නැහැ.ටිකක් වෙලා ඉදලා බලනකොට නැනී ගේ සුද්ද කරලා වැකුම් ක්ලීනර් එක ඕෆ් කරලා නෑ. ඉතින් සාරා ඒකත් ඕෆ් කරලා ආයෙත් කුස්සියට ගියා.

කොහොම හරි මෙයා බැලුවා හවසට කන්න හදන දේවල්.

"සොසේජස් එක්ක කරවල තෙල් දාලා"

"බත් එකට සුදු ලූණු පොඩි කරලා දාලා"

"චිකන් ඇතුළට කරවිල පුරවලා , කරවිල ඔම්බ්ලෙට්"
"පාන් පුඩින් හදලා විප් ක්‍රීම් දාලා උඩින් බැදපු ඉස්සෙක්"

"ඊයා...... මේවා කන්නෙ කොහොමද"

සාරා ට එකපාරටම හයියෙන් කෑගැහුනා.

සාරාට නැනී ඉන්න බව අමතක උනා.

" ඔයා මෙතන මොනවද කරන්නේ යනවා යන්න කාමරේට. මේවා කන්න බැරි නම් හවසට කන්න නෑ... හග්හග්හා......"

කොහොමෙන් කොහොම හරි රෑත් උනා. හැමදාම නැනී හවස 6.00 ට යනවා. සාරාගෙ අම්මයි තාත්තයි එනකොට 6.30 වෙනවා. "බායි සාරා" නැනී දොරත් වහගෙනම ගියා. කොහොම හරි ඉතින් අම්මයි තාත්තයි එනකම් සාරා බලාගෙන හිටියා. "පීප්. පීප්." කාර් එකේ නලාව වැදුනා.

"හලෝ අම්මෙ හලෝ තාත්තේ අද ඔෆිස් එකේ මොකද උනේ?? ඒත් මට." සාරා කියන්න යනකොටම අම්මා කිව්වා "හරි සාරා ඔයා හැමදාම ඔක කියන්න ඕනේ නෑ. නැනී ඔයාට සැර

කරන එක හොදයි. නැත්තම් කොහොමද ළමයෙක්ව හොදට හදන්නේ."

"හරි හරි දැන් යන්න මට මගේ මූනට හොද ට්‍රීට්මන්ට් එකක් දාන්න ඕනේ..  අද ගොඩාක් මහන්සි උනා. නේද පැටියෝ...ඒ වගේම මගේ මූනේ බිබිලි වගයක් දාලා ඒ ටික  මේක් අප් වලින් මකා ගන්න පුලුවන්ද බලන්නත් ඕනේ"

"හරි අම්මේ"සාරා ඇදට ගිහින් නිදාගන්න හදනකොට ම එයාට අම්මගෙන් අර ගාන හදන්න අහන්න හිතුනා සාරා පහළට ගිහින් අම්මගෙන් අහුවා මේ ගාන හදන්න කියලා දෙන්න පුලුවන්ද කියලා.

"මොනවද කියවන්නේ ළමයෝ??? ඕක ඔයාගේ මිස්ගෙන් අහගන්නවා, අනේ මගෙ ලිප් බාම් එක.... බබා!!

සාරා හොදටම බය වෙලා දුවගෙන ගියා කාමරේට. ගිහින් එයා හොදටම ඇඩුවා.

"මේ ගෙදර අයට මාව පොඩ්ඩක්වත් වැඩක් නැහැ. මම එළිය ගැන දන්නේ නැති උනාට කමක් නෑ. මම මේ ගෙදරින් යන්වා´´ සාරා අඩ අඩා ගෙදරින් පැනලා යන්න ලෑස්ති උනා" හිමින් හිමින් පහළ තට්ටුවට

බැහැලා දොර ඇරගත්තා. මෙයා බෑග් එකකට එයාගේ බෙඩ් ශීට් එකයි, ඔරලෝසුවකුයි,ටෝච් එකයි , කබායයි, කුඩේකුයි , බනිස් ගෙඩියකුයි ගත්තා.

## 6

මෙයා දොර ඇරිය ගමන් මේ ගෙදර පෙනනේ නැති දුරක් යනක්ම් දුවගෙන ගියා. මෙයා පාරෙ ඇවිදගෙන ගියා. සාරා මීට කලින් මෙච්චර දුරක් තනියම ගිහින් නෑ. සාරා  මෙහෙ පාරවල් ගාණ දන්නෙත් නෑ.

කොහොම හරි පැය දෙක තුනකට පස්සේ මෙයා එයාලගේ නගරේ මැද තියෙන පාළම යට බෝක්කුව අස්සට ගියා. ඒක ටිකක් ලොකුයි ඒක හරිම පිරිසිදුයි රෑට ඉන්න මෙතන මෙයා තෝරගත්තා.

මෙයාගෙ බෙඩ් ශීට් එක එලලා බෑග් එකේ ඔලුව තියා ගත්තා.බෙඩ් ශීට් එකේ එක කොනකින් එයා එයාගෙ ඇගට පොරව ගත්තා. මේක ඇත්තටම බෙඩ් ශීට් එකක් නෙවෙයි බ්ලැන්කට් එකක්.

කොහොම හරි මෙයාට රෑ නිදා ගත්තා.

ඔන්න ඉතින්

උදෙත් උනා. මෙයා නැගිටලා එළියට ගියා. ගිහින් අර ගෙනාපු බනිස් ගෙඩිය කෑවා. කොහොම හරි මෙයා ආයෙත් ඉතින් ඇවදගෙන ගියා.ටිකක් දුර ගියාට පස්සේ මෙයාගෙ වයසම පිරිමි ළමයෙක් හම්බුනා.

ඉතින් මේ දෙන්නා හම්බවෙලා කතා කරලා දැන අඳුර ගත්තා. ඇත්තටම කිව්වොත් සාරා ඉන්නෙ එයාගෙ ගෙදරට වඩා ගොඩාක් ඈතින් ඒ කියන්නේ මෙයා ඉන්නෙ වෙන නගරෙක. මේ පිරිමි නම හෙලන්.

7

හෙලන් සාරාට මේ නගරේ ගැන ගොඩක් විස්තර කිව්වා. ඉතින් මේ දෙන්නා හොදම යාලුවෝ වගේ තමයි හිටියේ.

දැන් සාරා ගෙදරින් ඇවිත් සතියකටත් ළගයි. මෙයාලට දැන් ඉන්න පුංචි තැනකුත් තියෙන්වා.සාරා ගොඩක් හෙලන්ව විශ්වාස කලා.මේ දෙන්නා ගොඩක් සතුටින් කාලය ගත කලා.ටික දවසින් ටික ටික හෙලන් වෙනස් වෙන්න පටන් ගත්තා.රෑට රෑට හෙලන් සාරාත් එක්ක වැඩිය ඉන්නෙ නෑ. හැම වෙලේම හෙලන් ඉන්නේ මොකද්දෝ බයෙන්.

"හෙලන් මොකද්ද ඔයාට් තියෙන ප්‍රශ්නේ" සාරා ඇහුවා. "ඈහ්.. නැ .නෑ. ඈහ්! ඔව්.. මොකුත් නෑ මම හොදින්" හෙලන් කලබලෙන් උත්තර දුන්නා.

හෙලන්ට මොකක් වෙලාද කියලා සාරට හොයාගන්න බැරි උනා.කොහොම හරි හෙලන් සාරව ගොඩක් මග

අරින්න බලනවා. සාරා කොච්චර ඇහුවත් ඒකට උත්තරයක් නම් නෑ.

සාරාට බයත් හිතෙනවා ඒත් මොනවා කරන්න ඒ නගරේ ඉන්න එකම යාලුවා හෙලන් විතයි.සාරා මේ හැමදෙම ඉවසන් හිටියා.

8

දවසක් හෙලන් සාරාට කිව්වා මෙහෙ මිනිස්සු හරි නපුරුයි ඔයා ආයෙත් ගෙදර යන්න කියලා.සාරා කිව්වා මෙච්චර දවස් මම මේ නගරේ ජීවත් උනේ. මම කරදරේ වැටුණු වෙලාවේ ඔයා තමයි මට උදව් කලේ.ඉතින් ඔයා කොහොමද කියන්නේ මේ මිනිස්සු නපුරුයි කියලා හෙලන්." නැහැ සාරා හැම මනුස්සයෙක්ම මම වගේ නෙවෙයි අනික ඔයාට වඩා කාලයක් මම මේ නගරේ ඉදලා තියෙනවා කරුණාකරලා... ඔයා ගෙදර යන්න" කියලා හෙලන් කිව්වා. "නැහැ මම ගෙදර යන්නෙ නෑ" සාරා කිව්වා.

සාරාට තේරුනා හෙලන් සාරාව මොකද්දෝ දෙයකින් ආරක්ෂා කරන්න හදනවා කියලා.ඒත් සාරා දන්නේ නෑ ඒ මොකකින්ද කියලා.

දවසක් හෙලන් දාඩිය දාගෙන දුවගෙන සාරා ළගට ආවා. " හ.... හම්මෝ.... සාරා සාරා ඔය දැන්ම ඔයාගෙ ගෙදර යන්න ඕනේ. දැන්ම ඉක්මන් කරන්න සාරා දුවන්න. ඔයාට

හිතන්න වෙලා නෑ. ඉක්මනට" හෙලන් ආපු ගමන්ම සාරාගෙ බෑග් එක ලෑස්ති කරගෙන කරේ දාගෙන සාරාත් එක්කම දුවන්න පටන් ගත්තා.

" හෝව් හෝව් මොකද්ද මේ වෙන්නෙ ඇයි මේ.

9

මොකද මේ අ........ මට කිසි දෙයක් තේරෙන්නෙ නෑ" සාරා කිව්වා. " ඔහොම ඉන්නවා ඔහොම නැවතියල්ලා. හොදින් කිව්වාම නැවතියල්ලා" පිටුපසින් හඹා එන මිනිස්සු කෑ ගහගෙන සාරලාගේ පස්සෙන් එනවා. "ඉන්න සාරා කටවහගෙන මම කිව්වනේ පස්සේ කියන්නම් කියලා." හෙලන් ටිකක් සැරෙන් වගෙ සාරට කිව්වා. සාරා ටිකක් බය උනා.

ටිකක් දුර ආවට පස්සේ ඒ කට්ටිය පෙන්නෙ නැති උනා. "මං හිතන්නේ ඒ ගොල්ලෝ අපිට මග ඇරුණා" දෙන්නම එකට කිවා. මේ දෙන්නම ඒ ළග ඉන්න හෙලන්ගේ ආච්චිලාගෙ ගෙදර ගියා. හෙලන් ආච්චිට සාරාව අදුන්වලා දුන්නා. සාරාටත් ආච්චිව අදුන්වලා දීලා ආච්චිට එනකොට උන විතරේ එහෙම පිටින්ම කිව්වා.අච්චිගෙත් සාරාගෙත් එකම ප්‍රශ්නෙ උනේ කවුද අර මිනිස්සු?? " හරි මම කියන්නම් ඒත් ආච්චි මුලින්ම මටයි සාරාටයි ටිකක් ඇග හෝදගන්න ඕනේ. දුවලා මහසි,ජරාවයි..." හෙලන් පිළිකුල් විදිහට කිව්වා. " හරි... මගෙ පුතාලා දැන් ටවල්

දෙක අරගෙන ගිහින් ඇඟ හෝදන් එන්න" කියලා කියන ගමන් ආච්චි සාරාගෙ පැත්තට ටවල් එකක් දැම්මා.

මේ දෙන්නම ඇඟ හෝදන් එනකොට හෙලන්ට කමිසෙකුයි කලිසමකුයි , සාරාටත් කමිසෙකුයි කලිසමකුයි ආච්චි

10

දාලා තිබ්බා. ඒ දෙන්නා ඒවා ඇඳගෙන එනකොට උණු උණු කෝපි දෙකකුයි බැදපු පාන් , කුකීස් එහෙම සාලේ මේසේ උඩ තියලා තිබුනා. මේ දෙන්නා හරිම සතුටින් එවා අරන් කාලා බීලා මුලින්ම බඩ ගින්න නිවා ගත්තා.

" මුලින්ම කියන්න කවුද අර මිනිස්සු? ඇයි එයාලා අපේ පස්සෙන් පැන්නුවේ? මොනවද එයාලට ඕනේ?" සාරා අමුතු විදිහට හෙලන් දිහා බැලුවා." හරි මම විස්තරේ කියන්නම්. හොඳට අහගෙන ඉන්න. මට සාරාව හම්බෙලා , දවස් දෙක තුනකට පස්සේ මම කඩේ යනකොට ඔය මිනිස්සු මාව පැත්තකට ඇදලා අරන් මගෙන් ඇහුවා කවුද සාරා කියලා. මම කිව්වා යාලුවෙක් කියලා. ඒ අය මට කිව්වා සාරා කියන්නේ හොඳ ධනවත් , නම්බුකාර පවුලක ළමයෙක් කියලා. සාරාට බල කරලා සල්ලි ටික ඉල්ල ගත්තොත් එහෙම අපිට පෝසත් වෙන්න පුලුවන් කිව්වා. එහෙම කලොත් මටත් ඉන්න තැනක් දෙනවා

කියලා කිව්වා. එහෙම නොකලොත් මගේ පවුලේ අයව...." හෙලන් කියන්න යන්කොටම "ඇති හෙලන් මට හොදටම තේරුනා එයාලට ඕනේ උනේ මගේ පවුලේ තියෙන සල්ලි ටික ගන්න. ඒත් ඔයා... ඔයා... මාව බේරගත්තා ඔයා තමා මාව බේරගත්තේ. " සාරා හෙලන්ව තදින් බදා ගත්තා. ඔයා තමා මගේ හොදම යාලුවා. හෙලන්. "

## 11

මේ වෙලාවේ හෙලන්ටයි සාරාටයි ආච්චිටයි ලොකු සතුටක් දැනුනා. හෙලන් සාරාගෙන් පොරොන්දුවක් ගත්තා අයෙත් එයා ගෙදර යන්ව කියලා. හෙලන් සාරාට තේරුම් කරලා දුන්නා පවුලක අගය.සාරා පොරොන්දුව ඉෂ්ට කරන්න පොරොන්දු උනා.

එදා හවසම හෙලනුයි සාරායි සාරලාගේ ගෙදර ගියා.සාරා ගෙදර යනකොටත් පොලීසියෙන් ගෙදර වට වෙලා පඩිපෙළේ ඉදන් අම්මයි තාත්තයි හොදටම අඩනවා. සාරා දුවගෙන ගිහින් එයාලට කතා කරා." අම්මේ තාත්තේ......" සාරා දුවගෙන ගිහින් ඒ දෙන්නව බදාගත්තා " අනේ මගෙ පුතේ ඔයා කොහෙද ගියේ අපි කොච්චර බය උනාද? ආයෙත් එහෙම වැඩ කරන්න එපා. අපි ඔයාට කොච්චර ආදරෙයිද ඒකෙ නිමක් නැහැ. සාරා මම ආයෙත් වැඩට යන්නෙ නෑ. තාත්තා විතරක් ගියාම ඇති... අපි ඔයාට ආදරෙයි පැටියෝ...... " අම්මයි තාත්තයි කිවා.

සාරා ඔක්කොම විස්තරේ අම්මටයි තාත්තටයි කිව්වා. අම්මා හෙලන්ට ගොඩක් ස්තූති කලා.

අම්මා හෙලන්ට සල්ලි කීපයකුත් දුන්නා. හෙලන් සාරාට කිව්වා ඔයා නිසා දැන් මට ආච්චිගේ ගෙදර ඉන්නත් පුලුවන් කියලා.

සාරා එයාට ගොඩක් සතූති කරා.

## 12

ඉතින් ඊට පස්සේ ආයෙ කවදාවත් නැනී ගෙදර ආවෙත් නෑ. හැමදාම හවසට වගේ සාරාට හෙලන්ව හම්බෙන්න යන්න අවසරත් ලැබුනා.අම්මා ආයෙ වැඩට ගියෙත් නෑ.ඉතින් මේ තුන් දෙනා හැමදාම සතුටින් හිටියා.

***දැක්කද පුංචි යාලුවනේ,***

***අම්මලාගෙ තත්තලාගේ ආදරේ කවදාවත් හැසිරීමෙන් මනින්න යන්න එපා. එයාලා කොච්චර බිසී උනත් එයාලට ඔයාව මහ මෙරක් තරම්ම වටිනවා. ඉතින් අද ඉදන් අම්මටයි තාත්තටයි කීකරුව විනීතව ඉන්න පුරුදු වෙනවා නේද? මට පොරොන්දු වෙනවා නේද? ඔයා ඔයාටම අවංක වෙන්න.***

***මම ඔයාලට පුංචි රහසක් කියන්නම්... මට පුලුවන් ඔයාල අම්මලාට කීකරුව ඉන්නවද කියලා***

*බලන්න. මට ඔයාගෙ ලගට ඕනෑම වෙලාවක එන්න පුලුවන්.ඔයා මොකක් හරි අම්මලාට කියන්නෙ නැතුව දග වැඩක් කරන්න යන්වනම් ඔන්න ඉතින් මතක් කරගන්න මේ පුංචි කතාව....*

<u>*සමාප්තයි*</u>

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01